**ශ්‍රේණිය - 10** | **විෂය - නර්තනය** | **සතිය - නොවැම්බර් 03**

01) පාඩම හෝ ඒකකය - සම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ කට්ටලයක ආකෘති නිර්මාණය කරමු.

02) ඉගෙනුම් ඵල -

- සාම්ප්‍රදායික නර්තනය හා බැඳි රංග වස්ත්‍රාභරණ කට්ටල නම් කරයි.
- එම රංග වස්ත්‍රාභරණ කට්ටලයන්ට අයත් කොටස් වෙන් වෙන්ව දක්වයි.
- එම රංග වස්ත්‍රාභරණ නිර්මාණය කිරීමේදී යොදා ගෙන ඇති අමුද්‍රව්‍ය නම් කරයි.
- මෙම රංග වස්ත්‍රාභරණ කට්ටල නිර්මානය සඳහා සම්ප්‍රදායිකව යොදාගෙන ඇති අමු ද්‍රව්‍ය වෙනුවට නිවසේදීම භාවිතාකළ හැකි විකල්ප/ ආදේශන අමු ද්‍රව්‍ය ඇතුළත් ලේඛනයක් සකස් කරයි.
- සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ කට්ටයක එක් කොටසක් තෝරාගෙන එහි ආකෘතියක් නිර්මානයට පෙළඹෙයි.

03) ශිෂ්‍යා කළ යුතු කාර්යයන් -

- ආදරණීය දුවේ පුතේ ඔබ මීට පෙර දේශීය නර්තන සම්ප්‍රදායයන් වල ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටල පිළිබඳව ඉගෙනගත් දැනුම යලි මතකයට නගාගන්න.
- දැන් එම රංග වස්ත්‍රාභරණ කට්ටල සහ ඒවායේ කොටස් වෙන් වෙන්ව මතකයට නගා ගන්න. ඔබ ළග රූප සටහන් තිබේ නම් ඒවාද අධ්‍යයනය කරන්න.
- මේ සඳහා e-nenapiyasa සාමාන්‍ය පාඩම් අධ්‍යයන කරන්න.
- ඔබ කැමති නර්තන සම්ප්‍රදායක රංග වස්ත්‍රාභරණ කට්ටයක එක් කොටසක් තෝරා ගන්න.
- එම කොටස සියුම්ව අධ්‍යයනය කරන්න.
- එය නිර්මාණය සඳහා යොදාගෙන ඇති අමු ද්‍රව්‍ය, වර්ණ, රේඛා, හැඩතල පිළිබඳව හොඳින් අධ්‍යයනය කරන්න .

1) ඔබ තෝරාගත් රංග වස්ත්‍රාභරණ කොටස නිර්මාණය සඳහා යොදා ගත හැකි අමු ද්‍රව්‍ය එක් රැස් කරගන්න.

2) ඔබ නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන රංග වස්ත්‍රාභරණ කොටසේ දළ සටහනක්/ ආකෘතියක් අඳින්න. (මේ සඳහා ගණකම් කාඩ්බෝඩ් භාවිතා කිරීම වඩා සුදුසු වේ.)

3) ඇඳගත් ආකෘතිය අනුව ඔබ රැස් කර ගත් අමු ද්‍රව්‍ය භාවිතා කර අවශ්‍ය කොටස් කපා ගනිමින් ඒවා අලවා ගනිමින් රංග වස්ත්‍රාභරණ කොටස නිර්මාණය කරන්න.

4) සකස් කරගත් රංග වස්ත්‍රාභරණ කොටස අලංකාර කර ගන්න. (මේ සඳහා ඔබට විසිතුරු ගල් වර්ග බොත්තම් හා පාට වර්ග සීකුවින්ස් යොදා ගත හැකිය.

5) ඔබ සකස් කර ගත් රංග වස්ත්‍රාභරණ කොටස් හා සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ කොටස් සංසන්දනය කරමින් ඔබම ඇගයීම සිදු කරගන්න.

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක -

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය නර්තනය - https://www.enenapiyasa.lk
- ගුරු ගෙදර - නැත
- වෙනත් - (YouTube) - https://www.youtube.com/watch?v=KPf2ZJ5oq64
  https://www.youtube.com/watch?v=ZszT3dWk2Ws
  https://www.youtube.com/watch?v=XpYRYOveClg
  https://www.youtube.com/watch?v=Yx_SbL9wRnc

05) අතිරේක පොත්/සගරා -

- 10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත, සෞන්දර්ය අධ්‍යාපන දෙපාතර්මේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.